**සැ. යු. -** 2017.06.16 වැනි දින පළ වූ අංක 2024 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,025 - 2017 ජුනි මස 23 වැනි සිකුරාදා - 2017.06.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 856 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 863 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 864 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 865 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජූලි මස 14 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 ජුනි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

855 – B 081181 — 403 (2017/06)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

MOD/DEF/02/01/ARF/ROG/09.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදාව**

අධිකාරියෙන් ඉවත් කිරීම වෙනුවෙන් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අවලංගු කිරීම

**ගැසට් නිවේදනය අවලංගු කිරීම**

2005 මැයි මස 20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ අධිකාරියෙන් ඉවත් කිරීමට අදල 2005 අංක 1394 (ඩීආර්එෆ්/21/ආර්ජීසී/2004) දරන ගැසට් නිවේදනය අතිගරු ජනාධිපති උතුමාණන් විසින් මෙයින් අවලංගු කරනු ලැබේ.

ලුතිනන් කර්නල් දයා පරාක්‍රම දිසානායක, සබුබ - (නි/50910)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

06 - 865/1

---

2017 අංක 702

MOD/DEF/02/01/ARF/ROG/09.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2004 ජනවාරි මස 29 වැනි දින සිට කර්නල් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික කර්නල් දයා පරාක්‍රම දිසානායක - (නි/50910)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2004 ජනවාරි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් දයා පරාක්‍රම දිසානායක - (නි/50910)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

06 - 865/2

---

2017 අංක 703

MOD/DEF/07/01/AVF/90/ENL.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

**අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්**

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2017 පෙබරවාරි මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බලසේනාව වෙත ඉදුරාම බඳවා ගැනීම් යටතේ බඳවාගෙන ලුතිනන් කර්නල් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා යුද්ධ හමුද වෛද්‍ය බළකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කෙඩෙට් නිලධාරී අසංග සම්පත් බස්නායක

කෙඩෙට් නිලධාරී මාන්නප්පේරු මුදියන්සේලාගේ ප්‍රේමසිරි අනුර බංඩාර

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 820

2017 අංක 704

MOD/DEF/07/01/AVF/910.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2017 මැයි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ගනෙහි අච්චිලාගේ කුසුම් ජයම්පති ගනෙහිආරච්චි, ශ්‍රීලසසබ - (නි/3746)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 821

---

2017 අංක 705

MOD/DEF/07/01/AVF/RET/818.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරී 2016 සැප්තැම්බර් මස 19 වැනි දින සිට කපිතන් නිලයේ නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් වලිමුනි දේවයලාගේ නිමල් ඉන්ද්‍රරත්න, ශ්‍රීලංජාආබමු - (නි/7363)

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2016 සැප්තැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් වලිමුනි දේවයලාගේ නිමල් ඉන්ද්‍රරත්න, ශ්‍රීලංජාආබමු - (නි/7363),

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

06 - 866

---

2017 අංක 706

MOD/DEF/07/01/AVF/RET/830.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2016 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් ජයසුන්දර මුදියන්සේලාගේ අසෝකා ජයසුන්දර - ආර්එස්පී, ශ්‍රීලංජාආබමු (නි/5397),

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

06 - 868

2017 අංක 707

MOD/DEF/07/01/AVF/RET/814.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බලසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරී 2016 ඔක්තෝබර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිනන් පිටියේ ගෙදර නන්දන නුවන් කුමාර, ගැහේබ - (නි/8644),

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

06 - 864

---

2017 අංක 708

MOD/DEF/03/02/RET/280.

ශ්‍රී ලංකා නාවික හමුදාව

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2017 සැප්තැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

රියර් අද්මිරාල් අගලවත්ත අසෝක ප්‍රින්ස්ලි ලියනගේ, ආර්එස්පී*, යූඑස්පී, පීඑස්සී, ඒඕඩබ්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0341

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

06 - 726

---

2017 අංක 709

MOD/DEF/03/02/RET/280.

ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2017 සැප්තැම්බර් මස 11 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

රියර් අද්මිරාල් අගලවත්ත අසෝක ප්‍රින්ස්ලි ලියනගේ, ආර්එස්පී*, යූඑස්පී, පීඑස්සී, ඒඕඩබ්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0341

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

06 - 727

---

2017 අංක 710

MOD/DEF/03/02/PRO/RNF/04/03.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2016 නොවැම්බර් මස 08 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන් :*

කොමදෝරු ප්‍රියරාජ් රසික බංඩාර දිසානායක, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0266

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

06 - 873

2017 අංක 711

MOD/DEF/03/02/PRO/RNF/04/04.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
ස්ථිර කිරීම්

*2017 මාර්තු මස 01 වැනි දින සිට කපිතාන් වශයෙන් :*

කොමාණ්ඩර් (නාසෙ) [තාවකාලික කපිතාන් (නාසෙ)] කුසල සමින්ද දිසානායක, යූඑස්පී ශ්‍රීලංනාහ - එන්ආර්පී 0746

කොමාණ්ඩර් (එන්ඩී) [තාවකාලික කපිතාන් (එන්ඩී)] යාපා රාජප්‍රිය සේරසිංහ, ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0821

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 725

---

2017 අංක 712

MOD/DEF/03/02/PRO/RNF/04/04.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

*2017 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කපිතාන් වශයෙන් :*

කොමාණ්ඩර් (මාලිමා) රනිල් ලසන්ත කුලරත්න, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0838
කොමාණ්ඩර් (අචි) හේරත් මුදියන්සේලාගේ බුද්ධික පේශාල් රූපසිංහ, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0843
කොමාණ්ඩර් (කිමි) අතුකෝරලලාගේ ක්‍රිෂාන්ත රොෂාන් අතුකෝරල, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0857
කොමාණ්ඩර් (එච්) ලේකම් අප්පුහාමිලාගේ දෙන් සංජීව ඉංදික කුමාර ප්‍රේමරත්න, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0840
කොමාණ්ඩර් (වි) ඕලකැලේ ගෙදර පුංචිරාල රාලලැ පාලින්ද රංජික හුංගම්පොල, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 0845
කොමාණ්ඩර් (ඉ) වෙස්ලි කුමාර අම්බලන්ගොඩ වඩුගේ, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්ර් 0916
වෛද්‍ය කොමාණ්ඩර් මිහිඳු විජේනායක - ශ්‍රීලංනාහ එන්ආර්එම් 1438,
කොමාණ්ඩර් (වියාබ) අරුණ ධනංජය විරසිංහ, ආර්එස්පී- ශ්‍රීලංනාහ, එන්ආර්ඉසෙඩ් 0965
කොමාණ්ඩර් (සිඉ) කළුආරච්චිගේ රවින්ද්‍ර ගුණසිංහ- ශ්‍රීලංනාහ, එන්ආර්සී 0959
කොමාණ්ඩර් (තොතා) චමින්ද විපුලජිත් රණවීර- ශ්‍රීලංනාහ, එන්ආර්ටී 0866,

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 824

---

2017 අංක 713

MOD/DEF/03/02/PRO/RNF/01/10.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
ස්ථිර කිරීම්

*2017 මාර්තු මස 01 වැනි දින සිට කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) [තාවකාලික කොමාණ්ඩර් (ඒඑස්ඩබ්] සන්දරාදුර යසන්ත ජයනාත් ද සිල්වා - ආර්එස්පී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1362
ලුතිනන් කොමාණ්ඩර් (සැ) [තාවකාලික කොමාණ්ඩර් (සැ)] අක්මීමන කුමාරගේ ප්‍රසන්න කුමාර අක්මීමන ශ්‍රීලංනාහ - - එන්ආර්එස් 1365
ලුතිනන් කොමාණ්ඩර් (අචි) [තාවකාලික කොමාණ්ඩර් (අචි)] තිලකසිංහ රාජ් ප්‍රසන්ත - ආර්එස්පී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1366
ලුතිනන් කොමාණ්ඩර් (සංඥා) [තාවකාලික කොමාණ්ඩර් (සංඥා)] හොඳමුණි අනුර ද සොයිසා, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඩබ්ඕ ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1189
ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) [තාවකාලික කොමාණ්ඩර් (නාසෙ)] හේරත් මුදියන්සේලාගේ දිලාන් කුමාර තිලකරත්න, ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්පී 1174
ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) [තාවකාලික කොමාණ්ඩර් (නාසෙ)] විජයරත්න මුදියන්සේලාගේ උපුල් ඉන්දික විජයරත්න, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්පී 1234

ලුතිනන් කොමාණ්ඩර් (එන්ඩ්) [තාවකාලික කොමාණ්ඩර් (එන්ඩ්)] බුසාබඳුල්ගේ ගයාන් ප්‍රසන්ග ප්‍රනාන්දු අබේසුන්දර වික්‍රමසූරිය, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1244
ලුතිනන් කොමාණ්ඩර් (එන්ඩ්) [තාවකාලික කොමාණ්ඩර් (එන්ඩ්)] ලොකුතඹුගල රාලලාගේ ජනක ගුණවර්ධන, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1286

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 724

---

2017 අංක 714

MOD/DEF/03/02/PRO/RNF/01/10.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්ථිර කිරීම්

*2017 ජූලි මස 01 වැනි දින සිට කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් කොමාණ්ඩර් (අවි) [තාවකාලික කොමාණ්ඩර් (අවි)] මාපිටිගම මුදියන්සේලාගේ රනුර යසන්ත මාපිටිගම, ආර්එස්පී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1111
ලුතිනන් කොමාණ්ඩර් (බීඑච්) [තාවකාලික කොමාණ්ඩර් (බීඑච්)] පොන්නන්විලගේ හිල්ටන් සුනන්ද සම්පත් අප්පුහාමි, පීඩබ්ඕ, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1374
ලුතිනන් කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) [තාවකාලික කොමාණ්ඩර් (ඒඑස්ඩබ්)] හෙට්ටිආරච්චිගේ ඇන්ටන් චමින්ද ප්‍රනාන්දු, ආර්එස්පී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1336
ලුතිනන් කොමාණ්ඩර් (පනිසෞ) [තාවකාලික කොමාණ්ඩර් (පනිසෞ)] ශාන්ත උඩුගම ගමගේ, ශ්‍රීලංනාහ - එන්ආර්ඩබ් 1309
ලුතිනන් කොමාණ්ඩර් (සංඥ) [තාවකාලික කොමාණ්ඩර් (සංඥ)] වීරසේකර වාසල මුදියන්සේලාගේ අසෝක බංඩාර වීරසේකර, ආර්එස්පී ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1260
ලුතිනන් කොමාණ්ඩර් (ඉ) [තාවකාලික කොමාණ්ඩර් (ඉ)] කාලෝගහගෙදර මංජුල පුෂ්ප කුමාර සේනාරත්න, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 1403
ලුතිනන් කොමාණ්ඩර් (ඉ) [තාවකාලික කොමාණ්ඩර් (ඉ)] තිස්සකුට්ටි ආරච්චිගේ දෙන් බන්දුල ප්‍රසාද් තිස්සආරච්චි, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 1414
ලුතිනන් කොමාණ්ඩර් (වාදක) [තාවකාලික කොමාණ්ඩර් (වාදක)] දෙවෙල්කන ගෙදර පලිපාන අතුල දයාකීර්ති, ශ්‍රීලංනාහ - එන්ආර්බී 1338

වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් [තාවකාලික වෛද්‍ය කොමාණ්ඩර්] නවරත්න හේරත් මුදියන්සේලාගේ චන්දන අත්තනායක, ශ්‍රීලංනාහ - එන්ආර්එම් 1816,

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 723

---

2017 අංක 715

MOD/DEF/03/02/RET/283.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2017 අගෝස්තු මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමාණ්ඩර් (සංඥ) ඉන්දික සුරංග මුණසිංහ, ආර්එස්පී*, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1078

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 819

---

2017 අංක 716

MOD/DEF/03/02/PRO/RNF/01/10.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2017 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් කොමාණ්ඩර් (අවි) සරත් ආනන්ද ඉලංගසිංහ, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1141

ලුතිනන් කොමාණ්ඩර් (එච්) පලිහවඩන ආරච්චිගේ ප්‍රගීත් සුදන්ත පෙරේරා, ආර්එස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1363,

ලුතිනන් කොමාණ්ඩර් (ඒඑස්ඩබ්) ජයකොඩි මුදියන්සේලාගේ ගංගානාත් බංඩාර ජයකොඩි, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1230

ලුතිනන් කොමාණ්ඩර් (සංඥ) රම්මිණි අමිල කල්හාර ධර්මවික්‍රම, ආර්ඩබ්පී, ආර්එස්පී*, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1157

ලුතිනන් කොමාණ්ඩර් (වියාබ) වීරසේකර ආරච්චිගේ චමින්ද ප්‍රසාද් වීරසේකර, ආර්එස්පී,* ශ්‍රීලංනාහ - එන්ආර්ඉසෙඩ් 1389

ලුතිනන් කොමාණ්ඩර් (සංඥ) කුළුගම්මන රන්කැටේ ගෙදර රෝලන්ඩ් සුදත් රත්නැන්න, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1300

ලුතිනන් කොමාණ්ඩර් (එන්ඩි) හේවා පත්තිනිගේ රසික ප්‍රසන්න අමරසිංහ, ආර්එස්පී*, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1304

ලුතිනන් කොමාණ්ඩර් (අවි) බස්නායක අප්පුහාමිලාගේ නිමන්ත දිලුම් තිසේරා, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1245

ලුතිනන් කොමාණ්ඩර් (එන්ඩි) ක්‍රාවෙ විජිත් ශ්‍රී ලෝහිත ද සිල්වා, ආර්එස්පී*, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1293

ලුතිනන් කොමාණ්ඩර් (එන්ඩි) හේවාවසම් පුවක්පිටියගේ මනුසංඛ හේවාවසම්, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 1394,

වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් වෙඩික්කාර කොඩිතුවක්කු කංකානන්ගේ දෙන් චත්තරී ධනංජය කොඩිතුවක්කු, ශ්‍රීලංනාහ - එන්ආර්එම් 1444

ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) මොනිකා අන්ජානි වාහලතන්ත්‍රි, ශ්‍රීලංනාහ - එන්ආර්සී 1571

ලුතිනන් කොමාණ්ඩර් (වි) එදිරාච්චරිගේ සංජීව රොෂාන් ජිනදස, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 1572

ලුතිනන් කොමාණ්ඩර් (ඉ) තෙන්නකෝන් මුදියන්සේලාගේ සුරේෂ් ගුණරත්න, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 1567

ලුතිනන් කොමාණ්ඩර් (වි) දූරගේ සුරංග චින්තන දිසානායක, ශ්‍රීලංනාහ - එන්ආර්එල් 1568

ලුතිනන් කොමාණ්ඩර් (ඉ) ගලගම ආරච්චිලාගේ ප්‍රදීප් චන්ද්‍රදස, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 1573

ලුතිනන් කොමාණ්ඩර් (ඉ) රන්නුළු සුරංග ද සොයිසා, ශ්‍රීලංනාහ - එන්ආර්ඊ 1340

ලුතිනන් කොමාණ්ඩර් (තොතා) කුලපති හේවගේ නදීර කුලපති, ශ්‍රීලංනාහ - එන්ආර්ටී 1459

ලුතිනන් කොමාණ්ඩර් (තොතා) චන්දන ප්‍රභාත් ගුණවර්ධන, ශ්‍රීලංනාහ - එන්ආර්ටී 1460

ලුතිනන් කොමාණ්ඩර් (තොතා) කාරියවසම් පතිර කංකානන්ගේ අරුණ චමින්ද කාරියවසම්, ශ්‍රීලංනාහ - එන්ආර්ටී 1461

ලුතිනන් කොමාණ්ඩර් (සිඉ) කෝනාර මුදියන්සේලාගේ ධම්මික දීපාල් බංඩාර කොලල්පිටිය, ශ්‍රීලංනාහ - එන්ආර්සී 1868

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 822

2017 අංක 717

MOD/DEF/03/02/RES/263.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2017 ජනවාරි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා නාවික හමුද නිත්‍ය බලකායේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් (ඉ) හේවා තමාඩුවගේ පේසල ප්‍රභාත් - එන්ආර්ඊ 2303, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

06 - 870

---

2017 අංක 718

MOD/DEF/03/02/PRO/RNF/01/10.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
නිලයේ ස්ථිර කිරීම්

*2017 මාර්තු මස 19 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර්] හේවා ලුණුවිල ආරච්චිගේ ගයාන් චන්දිමාල් ගුණවර්ධන - එන්ආර්එක්ස් 2338, ශ්‍රීලංනාහ

*2017 අප්‍රේල් මස 18 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (සැ) වශයෙන් :*

ලුතිනන් (සැ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) ] ෆ්‍රැන්සිස්කු හෙට්ටිගේ ලලින්ද සිල්වා - එන්ආර්එස් 2270, ශ්‍රීලංනාහ

*2017 අප්‍රේල් මස 25 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ) වශයෙන් :*

ලුතිනන් (නාසෙ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (නාසෙ)] මුදියන්සේලාගේ ශානක මධුමාල් පෙරේරා, - එන්ආර්පී 2261, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 869

---

2017 අංක 719

MOD/DEF/03/02/PRO/RNF/01/10.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

*2016 දෙසැම්බර් මස 23 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) පන්හිස් කෝරාලලාගේ තුෂාර සම්පත් - එන්ආර්ඊ 2530, ශ්‍රීලංනාහ

*2016 දෙසැම්බර් මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් රත්නාවල ගෙදර අසංක ප්‍රදීප් රාජපක්ෂ - එන්ආර්එක්ස් 2516, ශ්‍රීලංනාහ

ලුතිනන් දයාන් රොෂාන් ද රනබාහු - එන්ආර්එක්ස් 2520, ශ්‍රීලංනාහ

*2016 දෙසැම්බර් මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :*

ලුතිනන් (ඉ) අමිත් නිශාන්ත මාකොලගේ - එන්ආර්ඊ 2537, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 පෙබරවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

06 - 872

2017 අංක 720

MOD/DEF/03/02/PRO/RNF/01/10.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2017 ජනවාරි මස 13 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :*

ලුතිනන් වාඩිය රාල්ලෑ උජ්ජෝත දීක්ෂිත ධර්මසේන - එන්ආර්එක්ස් 2524, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මාර්තු මස 03 වැනි දින,
කොළඹ දී ය.

06 - 867

---

2017 අංක 721

MOD/DEF/03/02/PRO/VNF/02.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2017 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කපිතාන් (ස්වේ) වශයෙන් :*

කොමාණ්ඩර් (ස්වේ) නුවර පක්ෂ ගෙදර නිමල් වසන්ත, ශ්‍රීලංස්වේනාහ - එන්වීඑක්ස් 5188

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 818

2017 අංක 722

MOD/DEF/03/02/PRO/VNF/02.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2017 ජූලි මස 01 වැනි දින සිට තාවකාලික කොමාණ්ඩර් (ස්වේ) වශයෙන් ඃ*

ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) පියදසගේ අනිල් වික්‍රමසිංහ, ශ්‍රීලංස්වේනාහ - එන්වීඑක්ස් 5202,

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

06 - 823

017 අංක 723

MOD/DEF/03/02/RET/257.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක් සහ ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2015 සැප්තැම්බර් මස 09 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුද ස්වේච්ඡා බළකායෙන් විශ්‍රාම ගැන්වීම සහ එදින සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් (ස්වේ) මද්දුම හේවගේ ලක්ෂ්මන් - එන්වීඅයි 5186, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

06 - 871

## වෙනත් පත්කිරීම් ආදිය

2017 අංක 724

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ උපදේශක හා සම්බන්ධීකරණ මණ්ඩලය සඳහා සාමාජිකයෙකු පත් කිරීම**

1969 අංක 21 දරන මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය පිහිටුවීම සහ ඊට අදාළ කරුණු පිළිබඳ පනතෙහි 5(2) (b) (iv) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විශ්‍රාමලත් සර්වේයර් ජනරාල් කනගරත්නම් තවලිංගම් මහතා 2017.01.17 වැනි දින සිට බල පැවත්වෙන පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ උපදේශක හා සම්බන්ධීකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

වර්ෂ 2017 ක් වූ මැයි 18 වැනි දින,
කොළඹ දී ය.

06-710

# රජයේ නිවේදන

නිවේදනය අංක 1

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ උත්සවය - 2017

ඉහත සඳහන් උත්සවය 2017 ජූලි මස 24 වැනි දිනෙන් ආරම්භ වී 2017 අගෝස්තු මස 08 වැනි දින නිමාවට පත්වන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව පහත සඳහන් *ගැසට් පත්‍රවල* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි උත්සව කාලය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට ලක් කරමි.

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන *ගැසට් පත්‍රය*
1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන *ගැසට් පත්‍රය*
1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන *ගැසට් පත්‍රය*
1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන *ගැසට් පත්‍රය*
1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන *ගැසට් පත්‍රය*

ඩී. එස්. පත්මකුලසූරිය,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
කතරගම ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරී.

2017 මැයි මස 24 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

06 - 899/1

---

නිවේදනය අංක 2

**රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ උත්සවය - 2017**

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන *ගැසට් පත්‍රය*, 1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන *ගැසට් පත්‍රය*, 1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන *ගැසට් පත්‍රය*, 1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන *ගැසට් පත්‍රය*, 1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන *ගැසට් පත්‍රය* යන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රවල* පල වූ වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරවමි. එම රෙගුලාසි හා සම්බන්ධව පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

01. *කඳවුරු ප්‍රදේශය යනු :*

(අ) කතරගම මැණික් ගඟේ පැරණි තොටුපලේ සිට කිලෝමීටර් 1.6 ක අර්ධ විෂ්කම්භයකින් වට වූ ප්‍රදේශය හා,
(ආ) සෙල්ලකතරගම පුල්ලෙයාර් කෝවිලේ සිට කිලෝමීටර් 0.4 ක අර්ධ විෂ්කම්භයකින් වට වූ ප්‍රදේශය.

02. *ගොඩනැගිලි ඉදි කිරීම :*

මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් ලිඛිත අවසරයක් නොමැතිව කිසිවෙකු විසින් හෝ 2017 ජූලි මස 24 වන දින සිට 2017 අගෝස්තු මස 08 වන දින දක්වා වන කාලය තුළ කඳවුරු ප්‍රදේශය ඇතුළත කිසිම ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ වෙළෙඳසැලක් ඉදි නොකළ යුතු ය.

03. *යාචකයෝ :*

කතරගම මැණික් ගඟේ 02 වන පාලම අසල තනා ඇති යාචක මඩුව තුළ හෝ ඒ මඩුවේ සිට මීටර් 4ක් ඇතුළත මිස, පූජා පෙදෙසේ හෝ කඳවුරු පෙදෙසේ අන් කිසිම තැනක දී යාචකයන් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද, කිසිවෙකු විසින් හිඟමන් දීම හෝ බෙදා දීම ද නොකල යුතුයි.

04. *නෑම සහ සේදීම :*

මැණික් ගඟේ කතරගම ජලසම්පාදන ක්‍රමය හරහා ජලය ලබා ගන්නා ස්ථානයට සහ ඊට ඉහලින් කිලෝමීටර් 4.8 ක ප්‍රදේශය තුළ මැණික් ගඟේ කිසිවෙකු දිය නෑම හෝ රෙදි සේදීම හෝ සතුන් සේදීම නොකළ යුතු ය.

05. *වාහන :*

5.1 මාගේ හෝ බලයලත් නිලධාරියකුගෙන් ලබාගත් අවසරයක් රහිතව කිසිවකු විසින් මෝටර් වාහනයක්, බයිසිකලයක්, ගොන් කරත්තයක් හෝ කුමන ආකාරයක හෝ වාහනයක් පූජා පෙදෙසට (මැණික් ගඟේ නැගෙනහිර පෙදෙසට) පැදවීම හෝ ඇතුල් කිරීම නොකල යුතු ය.

5.2 කඳවුරට අයත් නව නගරයේ වාහන නතර කිරීමට වෙන් කර ඇති රිය ගාල්වල හැර කිසිදු වාහනයක් වෙනත් ස්ථානයක නතර කර නොතැබිය යුතු ය.

06. *කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානය :*

කඳවුරු පෙදෙසේ මවිසින් අවසර දුන් ස්ථානයේ හැර කිසිවෙකු විසින් කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානයක් පිහිටවනු නොලැබිය යුතුය.

07. *කාවාඩි කඩ :*

මාගෙන් හෝ බලයලත් නිලධාරියෙකුගෙන් ලබාගත් අවසර පත්‍රයක් මත මිස කිසිම ස්ථානයක කිසිවකු විසින් කාවාඩි කඩ පිහිටවනු නොලැබිය යුතුය.

08. වෙළඳාම ;

8.1 පූජා පෙදෙස, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලා ප්‍රදේශය, නැවතුම්පොල, අංක 1 හා 2 මගී පාලම්වල මාර්ගය යන ස්ථානවල සංචාරක වෙළඳාම තහනම්ය.

8.2 මවිසින් ඒ සඳහා අවසර දුන් ස්ථානය හැර කිසිවෙකු විසින් තින්නෝරු, අයිස්ක්‍රීම්, පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය වෙළඳාම් නොකළ යුතුය.

8.3 කිරි වෙහෙරට පිවිසුම් මාර්ගය දෙපසේ දැනට තනා ඇති මල් අලෙවි සැල්වල මල් අලෙවි කිරීම හැර කිසිවෙකු විසින් පූජා නගරය තුළ කඩයක් තැනීම, පවත්වාගෙන යාම, කිසිවක් වෙළඳාම් කිරීම නොකළ යුතුය.

8.4 සෑම ගොඩනැගිල්ලකම හා සෑම වෙළඳසැලකම කසල බඳුනක් තිබිය යුතු අතර, ස්ථානයේ අපද්‍රව්‍ය එහි බහාලිය යුතුය.

8.5 විකිණීමට තබා ඇති සකස් කළ සියළු ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිත පෙට්ටිවල රඳවා තැබිය යුතුය.

ඩී. එස්. පත්මකුලසූරිය,
මොණරාගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති සහ
කතරගම ඇසළ උත්සව කඳවුරු භාර නිලධාරි,

2017 මැයි මස 24 වැනි දින,
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

06 - 899/2

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක - 1781637, 1782210 සහ 1910039.
වළනගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර හෙවත් වළන්ගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර.

2017 ජනවාරි මස 27 වැනි දින පැවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ෆිලිෂියන් ප්‍රනාන්දුපුල්ලේ විසින් 2007 පෙබරවාරි මස 27 වැනි දින සහතික කරන ලද අංක 9360 සහ 2012 ජනවාරි මස 29 වන දින සහතික කරන ලද අංක 17053 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එල්. ජයවීර විසින් 2012 දෙසැම්බර් 19 වන දින සහතික කරන ලද අංක 3679 දරන දූන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දවූ ද බැඳුම්කරයන් යටතේ (මෙහි පළවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වළනගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර හෙවත් වළන්ගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර ණයකරු හැටියට පැහැර ඇති හෙයින් ද,

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ෆිලිෂියන් ප්‍රනාන්දුපුල්ලේ විසින් 2007 ජුලි 31 වන දින සහතික කරන ලද අංක 10020 සහ 2012 දෙසැම්බර් මස 10 වන දින සහතික කරන ලද අංක 17960 දරන දූන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දවූ ද බැඳුම්කරයන් යටතේ (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වළනගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර ණයකරු හැටියට පැහැර ඇති හෙයින් ද,

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ෆිලිෂියන් ප්‍රනාන්දුපුල්ලේ විසින් 2007 ජුලි 31 වන දින සහතික කරන ලද අංක 10015 සහ 2013 පෙබරවාරි මස 19 වන දින සහතික කරන ලද අංක 18043 දරන දූන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දවූ ද බැඳුම්කරයන් යටතේ (මෙහි තෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වළනගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර ණයකරු හැටියට පැහැර ඇති හෙයින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2013 ජුලි 03 වන දින සහතික කරන ලද අංක 2080 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්දවූ ද බැඳුම්කරයන් යටතේ (මෙහි හතරවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වළනගොඩගේ නලින් ඇන්ටන් රවින්ද්‍ර රණවීර ණයකරු හැටියට පැහැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්කෝටි විසිලක්ෂ හැටහතරදහස් හාරසිය තිස් දෙකයි ශත හැත්තෑව (රු. 32,064,432.70)ක මුදලක් 2016 දෙසැම්බර් 05 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට දූන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්කෝටි විසිලක්ෂ හැටහතරදහස් හාරසිය තිස් දෙකයි ශත හැත්තෑව (රු. 32,064,432.70) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2016

දෙසැම්බර් 06 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 19,961,103 ක මුදල මත 15.62% ක වැඩිපුර වාර්ෂික පොළිය ද, (PLR + 4% වාර්ෂික පොළිය) රු. 6,750,000 ක මුදල මත 14.62% ක වැඩිදුර වාර්ෂික පොළිය ද, (PLR + 3% වාර්ෂික පොළිය) සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 9360, 17053, 3679, 10020, 17960, 10015, 18043 සහ 2080 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි පළවන, දෙවන, තුන්වන සහ හතරවන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ඩොප් වීදියේ 2 වන මහලේ අංක 200 හි පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දසියා පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැවගෙදර ග්‍රාම නිලධාරි වසමේ, දිවුලපිටිය හි පිහිටි "කටුවේහේන" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් 2003 නොවැම්බර් 19 වැනි දින සාදන ලද අංක 1120/2003 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ඉඩමට මායිම් වශයෙන්, උතුරට : මෙම ඉඩමේ ම ලොට් 2 සහ ජේ. ප්‍රනාන්දු ට අයිති කුඹුරෙන් ද, නැගෙනහිරට : ප්‍රධාන පාර සහ මෙම ඉඩමේම ලොට් 2 න් ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 5 (අඩි 4 ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) සහ ප්‍රධාන පාරෙන් ද සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 5 (අඩි 4 ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) න් ද, මායිම් වූ එකී අංක 1120/2003 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිදෙකයි දශම බිංදුවයි අට (අ. 0, රූ. 0, පර්. 22.8) ක නමුත් වඩාත් නිවැරදි පර්චස් විසිදෙකයි දශම අට (අ. 0, රූ. 0, පර්. 22.8) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 481/75 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ, පිටිගල් කෝරළේ කටුගම්පොළ හත් පත්තුවේ, පහළ මාකඳුර කටුගම්පොළ හි පිහිටි දික්පිල්ලෑව නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් 1998 අප්‍රේල් 30 වැනි දින සාදන ලද අංක 1785 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : පාරෙන් ද (පීඑස්), නැගෙනහිරට : පාරෙන් ද (පීඑස්) සහ විජේසේනගේ ඉඩමෙන් ද, දකුණට : විජේසේනගේ ඉඩම සහ තිලකරත්න විජේසිංහගේ කුඹුරෙන් ද, බස්නාහිරට : ඒ. මර්සි ප්‍රනාන්දුගේ ඉඩමෙන් ද, මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් පහළොව (අ. 0, රූ. 2, පර්. 15) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව S 105/105 යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ, පිටිගල් කෝරළේ කටුගම්පොළ හත් පත්තුවේ, ඉහළ මාකඳුර හි පිහිටි දික්පිල්ලෑව වත්ත නැමති ඉඩමට මායිම් වශයෙන්, උතුරට : පිල්ලෑව සහ විසි පාරෙන් ද, නැගෙනහිරට : ඩබ්ලිව්. සුසිල් චන්ද්‍රගේ ඉඩමෙන් ද, දකුණට : කුඹුරෙන් ද, බස්නාහිරට : කුඹුරෙන් ද, මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් දෙක (අ. 0, රූ. 2, පර්. 0) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව S 49/190 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම පිඹුරට අනුව මෑතක දී කරන මැනීමකින් එය පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසය තුළ, පිටිගල් කෝරළේ කටුගම්පොළ හත් පත්තුවේ, ඉහළ මාකඳුර හි පිහිටි දික්පිල්ලෑව වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් 2004 අගෝස්තු 20 වැනි දින සාදන ලද අංක 7855 දරන පිඹුරේ ඉඩමට මායිම් වශයෙන්, උතුරට : පාරෙන් ද (පීඑස්), නැගෙනහිරට : වසන්ත සුසිල් චන්ද්‍රා මුණසිංහ සහ සමන්ත මුණසිංහගේ එකම ඉඩමේම කොටසකින් ද, දකුණට : ලාල් සමරවීර සහ අනෙකුත් අයගේ කුඹුරෙන් ද, බස්නාහිරට : කුඹුරෙන් ද නමුත් දැන් එස්. ඒ. ස්ටැනිස් ප්‍රියන්තගේ ඉඩමෙන් ද, මායිම් වූ පිඹුර ප්‍රකාරව රූඩ් දෙකයි පර්චස් හයයි දශම පහ (අ. 0, රූ. 2, පර්. 6.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

මෙම ඉඩම පන්නල ප්‍රාදේශීය සභා සීමාව තුළ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළ මාකඳුර අංක 1588 දරන ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇත.

### හතරවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දසියා පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝම්බුගම්මන 97A ග්‍රාම නිලධරි වසමේ බෝම්බුගම්මන ගමෙහි පිහිටි "කහටගහවත්ත හෙවත් මිල්ලගහලන්ද" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සෙනරත් විසින් 2005 මාර්තු 30 දින සාදන ලද අංක 2582 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන්, උතුරට : ටී. ජේ. එස්. පී. ෆොන්සේකාගේ ඉඩමෙන් ද, නැගෙනහිරට : දිවුලපිටිය විවිධ සේවා සමුපකාර සමිතියේ ඉඩම සහ ටී. ජේ. එස්. පී.

ෆොන්සේකාගේ ඉඩමෙන් ද, දකුණට : ලොට් 2 (මීනුවන්ගොඩ පාරේ වරිපනම් අංක 21) ද සහ බස්නාහිරට : ලොට් 2 (මීනුවන්ගොඩ පාරේ වරිපනම් අංක 21) සහ මීනුවන්ගොඩ - ගිරිඋල්ල ප්‍රධාන පාරෙන් ද, මායිම් වූ එකී අංක 2582 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකයි දශම අටයි දෙක (අ. 0, රූ. 0, පර්. 1.82) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව J 29/95 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය.
සමාගම් ලේකම්.

2017 ජනවාරි මස 27 වැනි දින,

06 - 784

---

## මහජන බැංකුව - මැජෙස්ටික්සිටි ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017.04.27 දින පවත්වන ලද ස්වකීය මණ්ඩල රැස්වීමේ දී පහත යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එන්. පෙරේරා විසින් සහතික කරන ලද 2016.12.07 දින අංක 5216 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 501F, 3 වන මහල, යුනිටි ප්ලාසා, කොළඹ 04 යන ලිපිනයේ පිහිටා ඇත්තා වූ ද, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන ටෙක් ඉන්ෆෝමේෂන් සොලියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්, අයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 5216 දරන උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකුව වෙත රුපියල් මිලියන හැත්තෑවක් වූ (රු.70,000,000/-) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතු ව ඇති හෙයින් ද, අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව සහ විකිණීමේ පිරිවැය සහ වෙනත් ගාස්තු ද සමග 2016.12.22 දින සිට වෙන්දේසි දිනය දක්වා වර්ෂයකට 17% ක පොළී මුදලක් ද, සමග ඉහත කී රුපියල් මිලියන හැත්තෑවක් වූ (රු.70,000,000/-) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී උකස් බැඳුම්කර මගින් ඉහත කී බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර අර්වින් පෙරේරා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උකස් දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් ලේකම් කොට්ඨාසයේ, වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැල්ලවත්ත උතුර අංක 43 දරන කොට්ඨාසයේ දුම්රිය නැවතුම්පල පාර වර්තමානයේ වරිපනම් අංක 14 දරන දුම්රියපල පාර ඔස්සේ පිහිටා ඇත්තා වූ "මහවේල්ලවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද 1980.03.19 දින අංක 2469 දරන පිඹුරේ ලොට් "3BIC" ලෙස ලකුණුකර ඇත්තා වූ ද, උතුරට : දුම්රියපල පාර ද, නැගෙනහිරට : ලොට් "3BIA" සහ ලොට් "3BIB" දරන කොටස් ද, දකුණට : ලොට් "3B2", "3B3" සහ "3B1B" දරන කොටස් ද, බටහිරට : ලොට් "3B5" (ඉතිරි ප්‍රදේශය) දරන කොටස ද යන මායිම් තුළ පිහිටි එකී අංක 2469 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හයයි තුනයි හතරක් වූ (අ.0, රූ.0, පර්. 11.634) කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ SPE 45/70 දරන වෙළුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇති එකී ලොට් අංක "3BIC" දරන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගහකොළ, ගොඩනැගිලි, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කලාප කළමණාකරු,
(කොළඹ - දකුණ).

06 - 831

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඩී.එම්.සී.එන්. සී. දිසානායක.
ගිණුම් අංක : 0113 5000 2997.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017.04.27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දි පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ.ඒ.පී. කහඳව යන අය විසින් ලියා සහතික කරන ලද 2014 ජුනි 23 දාතම හා අංක 844 දරන සහ 2015 මැයි 05 දාතම හා අංක 1189 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට

ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දිසානායක මුදියන්සේලාගේ චින්තක නාමල් ක්‍රිෂාන්ත දිසානායක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින් ද එකී අංක 844 සහ 1189 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක් කෝටි හතලිස් අට ලක්ෂ හැට හතර දහස් අනූ නවයක (රු. 14,864,099.00) මුදලක් 2017 අප්‍රේල් 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක්කෝටි හතලිස් අට ලක්ෂ හැට හතර දහස් අනූ නවයක (රු. 14,864,099.00) මුදලද, 2017 අප්‍රේල් 12 වැනි දින සිට අංක 844 සහ 1189 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි විසි තුන් ලක්ෂ අසූ පන් දහස් හයසිය හැත්තෑ නවයයි ශත තිස් හතරක (රු. 12,385,679.34) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) බැගින් වු පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 844 සහ 1189 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

## උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ මහපළාත කෝරළේ බණ්ඩාරවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ සහ හපුතලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අඹේගොඩ, 67- සී ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මැටිපිම්බිය ග්‍රාමයේ පිහිටි "WYE එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට (එම මානක තැන විසින් 2014 මැයි 02 දින නැවත මැන සහ සීමා මායිම් සනාථ කරන ලද) බලයලත් මානක තැන පී.ඩබ්ලිව්. නන්දසේන යන අය විසින් සාදන ලද 1996 ජනවාරි 20 දාතම හා අංක 969 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ගම් සහා පාර, නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස (අංක 566 දරන පිඹුරේ ලොට් 1) දකුණට : කඳුර සහ බස්නාහිරට : කඳුර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් 10 (A: 0, R: 0, P: 10) හෝ හෙක්ටයාර 0.026 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 969 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව V 06/ 112 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06 - 847

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ආර්. එස්. කහඳූව සහ ආර්. දිල්රුක්ෂි.
ගිණුම් අංක : 1047 5468 8777 / 0047 5000 4747.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017.04.27 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. දෙල්පෙවිත්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2015 මාර්තු 27 දාතම හා අංක 1602 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රන්ගන සම්පත් කහඳූව නොහොත් කහඳූව රන්ගන සම්පත් සහ රතුවඩුගේ දිල්රුක්ෂි යන අය බන්ධනදායීන් වශයෙන් හා එකී රන්ගන සම්පත් කහඳූව නොහොත් කහඳූව රන්ගන සම්පත් යන අය උකස්කරු වශයන් පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාල පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. දෙල්පෙවිත්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2015 නොවැම්බර් 17 දාතම හා අංක 1960 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රන්ගන සම්පත් කහඳූව නොහොත් කහඳූව රන්ගන සම්පත් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින් ද,

එකී අංක 1602 සහ 1960 දරන බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් අසූ හතර ලක්ෂ පනස් නව දහස් නවසිය හතලිස් එකයි ශත හැත්තෑ එකක (රු. 8,459,941.71) මුදලික් 2017 අප්‍රේල් 16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අසූ හතර ලක්ෂ පනස් නව දහස් නවසිය හතලිස් එකයි ශත හැත්තෑ එකක (රු. 8,459,941.71) මුදල ද, 2017 අප්‍රේල් 17 දින සිට අංක 1602 සහ 1960 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට දෙලක්ෂ හය දහස් තුන්සිය පනස් තුනයි ශත අනූ හයක (රු. 6,206,353.96) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයයි දශම පහක් (9.5%) හා තවත් රුපියල් දහ නව

ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය පනස් හතරයි ශත විස්සක (රු. 1,943,754.20) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයයි දශම පහක් (10.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1602 සහ 1960 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි.ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාවන් තුළ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පට්ටිය උතුර අංක 685 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පට්ටිය පිහිටි ආතර් වි. ඩයස් මාවත වරිපනම් අංක 101 දරන "මාදංගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2015 පෙබරවාරි 12 දාතම හා අංක 7524 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : නගර සභා පර්ශ්‍රයන් වෙත දිවෙන පාර, නැගෙනහිරට : අංක 186 දරන පිඹුරේ ලොට් 4, දකුණට : අංක 186 දරන පිඹුරේ ලොට් 2 සහ කලින් ටී. ඩී. පෙරේරා යන අයගේ දේපළ, බස්නාහිරට : ආතර් වී. ඩයස් මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම එකයි බිංදුවක් (A: 0 R: 0 P: 9.10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 7524 දරන පිඹුරට අනුවය.

අංක 7524 දරන පිඹුරේ නිරූපිත එකී ඉඩම පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී පට්ටිය පිහිටි "මාදංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. එල්. ඩී. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1975 නොවැම්බර් 05 දාතම හා අංක 186 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර, නැගෙනහිරට : ලොට් 4, දකුණට : ටී. ඩී. පෙරේරා සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ ලොට් 2 බස්නාහිරට : ආතර් වී. ඩයස් මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම එකයි බිංදුවක් (A: 0 R: 0 P: 9.10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 186 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව D 209/110 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06 - 848

### ලංකා බැංකුව

### 1968 අංක. 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය ) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2017.05.17 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් වාගා ලාවන්යා යාපා විසින් සහතික කරන ලද 2014.07.31 දිනැති අංක 75 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2015.08.25 දිනැති අංක 1146 දරන උකස් බැඳුම්කර අනුව 2017.04.19 දින තෙක් අයිරාව මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි හය ලක්ෂ පනස් දෙදහස් පනස් හතරයි ශත හැත්තෑ නවයක (රු. 10,652,054.79) මුදල සමග රුපියල් එක්කෝටියක (රු. 10,000,000.00) මුදල මත වසරකට සියයට දහහත (17%) බැගින්ද 2017.04.20 වැනි දින සිට කාලීන ණය මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැටහත් ලක්ෂ අටදහස් අටසිය එකොළහයි ශත පනස් එකක (රු. 6,708,811.51) මුදල සමග රුපියල් හැටතුන් ලක්ෂ හැත්තෑ හතර දහස් නවසිය අනූපහක (රු. 6,374,995.00) මුදල මත වසරකට සියයට දහසය (16%) බැගින් 2017.04.19 වැනි දින සිට ණය මාලාව මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි දස ලක්ෂ හැත්තෑ අටදහස් දෙසිය පහළොවයි ශත අසූ එකක (රු. 11,078,215.81) මුදල සමග රුපියල් එක්කෝටියක (රු. 10,000,000.00) මුදල මත වසරකට සියයට දහසය (16%) බැගින් පොලියක් 2017.04.20 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මහරගම, පමුණුව, අංක 92 බී හි සීමාසහිත ස්කයි සෙරමික්ස් (පුද්ගලික) සමාගම වෙතින් (මාලඹේ, තලාහේන, බෝගහවත්ත පාරේ, අංක 765 ඒ හි පදිංචි විතින්ව සම්පත් ගජධීර මහතා සහ හිමාලි ජයවර්ධන මිය අධ්‍යක්ෂවරු වෙති) අයවිය යුතුව ඇත.

2. 2014.07.31 දිනැති අංක 75 දරන උකස් බැඳුම්කරය සහ 2015.08.25 දිනැති අංක 1146 දරන උකස් බැඳුම්කර අනුව අයිරාව මත රුපියල් එක්කෝටි හය ලක්ෂ පනස් දෙදහස් පනස් හතරයි ශත හැත්තෑ නවයක (රු. 10,652,054.79) සහ කාලීන ණය මත රුපියල් හැටහත් ලක්ෂ අටදහස් අටසිය එකොළහයි ශත පනස් එකක (රු. 6,708,811.51) මුදල සමග ණය මාලාව මත රුපියල් එක්කෝටි දස ලක්ෂ හැත්තෑ අටදහස් දෙසිය පහළොවයි ශත අසූ එකක (රු. 11,078,215.81) මුදලක් 2017.04.20 වැනි දින විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එම් ඔක්ෂන්ස් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය

යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, නුගේගොඩ අධිශ්‍රේණි ශාඛාවේ ප්‍රධාන කළමණාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලෙපත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 477/ A දරන තලංගම උතුර - B ග්‍රාම සේවා කොට්ඨාසයේ කඩුවෙල මහනගර සභා සීමාවේ උතුරු තලංගම පිහිටි තලාහේන පාරේ වරිපනම් අංක 14/43 දරන බෝගහවත්ත හෙවත් බෝගහලන්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. එස්. අත්තනායක විසින් සාදන ලද 2014 මැයි 27 දිනැති අංක 4549 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : බෝගහවත්ත පාර ද, නැගෙනහිරට : අංක 8346 B දරන පිඹුරෙහි ලොට් 1 B ද, දකුණට : පිඹුරු අංක 7/33 හි ලොට් 1 ද, බස්නාහිරට : ජී. පී. ඉන්ද්‍රාණි පෙරේරා උරුමකම් කියන ඉඩමද මායිම්ව එකී අංක 4549 දරන පිඹුරට අනුව පර්චස් 20 ක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සහ වැවෙන ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි සමග වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 746/40 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි.එස්.එන්. පෙරේරා මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
නුගේගොඩ අධිශ්‍රේණි ශාඛාව.

06 - 901

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.